(X4)

දණ්ඩ / මහේස්ත්‍රාත්
02 SEP 2016
මොණරාගල

නඩු අංකය :- 24692

ස්ථානාධිපති,

විශේෂ අපරාධ විමර්ශන අංශය,

මොනරාගල.

- පැමිණිලිකරු -

එදිරිව :-

මොහොමඩ් ජෙමිල් මොහොමඩ් අපාන්,

අංක 23/32,

මුස්ලිම් විදිය,

තංගල්ල.

- විත්තිකරු -

TRUE COPY
N. Kodituwakku
Attorney-at-Law & Solicitor

02 SEP 2016
මොණරාගල

සොරකම් කරන ලද චෙක්පතක් මගින් රු. 3,00000/- ක් වටිනා කම සඳහන් කර රු. 1,50000 ක මුදලක් ඇතුලු මුල මුදල රු. 4,50,000/- ක් මුදල් වංචා කිරීම හා විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් කරුණු වාර්තා කරමින් අත් අඩංගුවට ගන්නා ලද සැකකරුවකු ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම.

ශ්‍රී ලංකා පොලිසිය

මහේස්ත්‍රාත් වෙත සැපයෙන තොරතුරු

තො.පො. පිටුව : 128 අධිකරණය : මොණරාගල.

එස්.සි.අයි.බී. නඩුවේ අංකය : බී.ආර්. 574/05

තො.පො. ජේදය : 230

අ.නො.වෙ.වැ.ලේ : අයි.ආර්. 30/05

1979 අංක 15 දරණ නඩු විධාන සංග්‍රහ පනතේ XI වැනි පරිච්ජේදයේ

115(1), (2),(3),(4),120(1),(2),(3) වැනි වගන්ති යටතේ

වරදක් විමර්ශනය කිරීමේ වාර්තාව.

මහේස්ත්‍රාත්වරයා වෙතය,

සොරකම් කරන ලද චෙක්පතක් මගින් රු. 3,00000 ක් වටිනා කම සඳහන් කර ලබා දී රු. 1,50,000 ක මුදලක් ඇතුලු මුල මුදල රු. 4,50000 ක්

02 SEP 2016



වංචා කිරීම හා විශ්වාසය කඩ කළ බවට අංක 114, වැල්ලවාය පාර, මොණරාගල පදිංචි සුමේධා පී. ජයසේන විසින් 2005.07.24 වැනි දින කරන ලද පැමිණිල්ල විභාග කළ බව මොනරාගල පොලිසියේ වි.අ.වි.අංශයෙහි ස්ථානාධිපති උ.පො.ප. ජයරත්න වන මම මෙයින් වාර්තා කරමි.

පැමිණිලිකාරිය අංක 114, වැල්ලවාය පාර, මොණරාගල ලිපිනයේ පදිංචි සුමේධා පී. ජයසේන මහත්මිය ඉහත ලිපිනයේ පදිංචිව සිටින අතර මොණරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වරියක ලෙස හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජන රජයේ කාන්තා අභිවෘද්‍ධි හා සමාජ සුභසාධන අමාත්‍යවරිය වශයෙන් කටයුතු කරයි. පැමිණිලිකාරිය හට පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ට හිමි වූ තීරුබදු රහිත වාහනයක් ගැනීමේ අයිතිවාසිකම යටතේ ලියාපදිංචි අංකඃ ඩබ්ලිව්පීඑච්ඩී 7733 දරන ටාටා ඩීසල් වර්ගයේ ජීප් රථය මිලදී ගෙන එය පාවිච්චි කරමින් සිටියදී මෙම වාහනය විකිනීමට අවශ්‍ය බව තම හිතවත් පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් හා හිතවත්කම් හා සම්බන්ධකම් පවත්වාගෙන ගිය පැමිනිලිකාරිය ද වසර 03 ක පමන සිට දන්නා හදුනන අංක 23/32 මුස්ලිම් පල්ලිය පාර, තංගල්ල ලිපිනයේ පදිංචි මෙහොමඩ් ජේමිල් මොහොමඩ් අෆාන් නැමැති අය 2004.02.05 වන දින පැමිනිලිකාරියගේ නිවසට පැමින පැමිණිලිකාරිය හමුවී ඉහත අංක දරන වාහනය විකුනනවාද විමසා එම වාහනය රුඃ 22,00000/- ට විකුනන බව පැමිනිලිකාරිය දැනුම් දීමෙන් පසු එයට වඩා වැඩි මුදලකට විකුනා දෙන බව පවසා 2004.02.10 වන දින පැමිනිලිකාරියගේ නිවසට පැමින රුඃ 10,00000/- ක මුදලක් ලබා දී වාහනය රැගෙන ගිය බවත්, වාහනය සදහා රුඃ 20,50000/- ක් ලබා දීමට ගිවිස ගෙන 2004.06.16 වන දින නැවත රුඃ 6,00000/- ක මුදලක් ලබා දී වාහනයේ ලේඛණ හැරවීමෙන් පසු ඉතිරි මුදල් ලබා දීමට පොරොන්දු වී ඇත. 2004.05.13 වන දින එම්.ජේ.එම්. අසාප් යන අය කොළඹගේ ආර,

02 SEP 2016
මොණරාගල

කොට්ටවත්ත ලිපිනයේ පදිංචි එන්.ඩබ්ලිව්.බී. සිරිසේන යන අය සමඟ පැමිණ ඔහු වාහනයේ ගැනුම්කරු වශයෙන් පෙන්වා ඉතිරි මුදල් 4,50000/- ක මුදල ඉක්මනින් ලබා දීමට කටයුතු කරන  බව පවසා පැමිණිලිකාරිය ලවා වාහනයට අදාල ලේඛණ අත්සන් කරවාගෙන ඇත.  පසුව මාස කිහිපයක් යන තුරු ඉතිරි මුදල් නොදීම නිසා එම මුදල් ඉල්ලා දන්වා සිටි විටදී එම්.ජේ. අසාප් යන අය විසින් දෙහිවල සෙලාන් බැංකුවේ අංක 771149001 දරන ගිනුමට අයත්, අංකः 254313 දරන චෙක්පතින් රුः 3,00000/- ක මුදලක් වටිනාකම සදහන් කර 2004.08.31 දින යොදා පැමිනිලිකාරියට 2004.08.31 වන දින ලබා දී ඉතිරි මුදල් රුः 1,50000/- මුදල ද, ඉක්මනින් ලබා දීමට පොරොන්දු වී ඉහත අංකः දරන චෙක්පත ගිනුම් ගත නොකරන ලෙස ඉල්ලා ඇත.  පසුව පැමිනිලිකාරිය එම්.ජේ.එම්. අසාම් යන අය කෙරෙහි වූ විශ්වාසය මත චෙක්පත බැංකු ගත නොකර පසුව එම මුදල් ලබා දීමට කටයුතු නොකිරීම නිසා 2004.11.30 වන දින මුදල් මාරු කර ගැනිම සදහා බැංකු ගත කර ඇත.  එහි අණකරු විසින් ගෙවීම් නතර කර ඇත යනුවෙන් සදහන් කර මෙම චෙක්පත පැමිණිලිකාරිය වෙත ආපසු ලබා දී ඇත.  පසුව පැමිනිලිකාරියගේ ආරක්ෂක නිලධාරීන් සමන්ත නිලධාරියා මගින් මෙම එම්.ජේ.එම්. අසාප් යන අය හමුවී මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසට දන්වා ඇතත්, ඔහු මුදල් නොදී මගහරිමින් සිටින බව සදහන් කරමින් පැමිණිල්ලක් මෙම අංශය වෙත කර ඇත.

මෙම වරද ල.ද.නි.ස. 367, 403, 389 වගන්ති යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.

02 SEP 2016



මෙම් අපරාධය සම්බන්ධයෙන් මා විසින් පරීක්ෂණ පවත්වන ලද අතර, සැකකරු වන අංකඃ 22/32; මුස්ලිම් පල්ලිය පාර, තංගල්ල ලිපිනයේ පදිංචි මොහොමඩ් ජෙමිල් මොහොමඩ් අපාන් යන අය අත්අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරමි. මෙහි විමර්ශන කටයුතු අවසන් නොමැති බැවින් සැකකරු 2005.08.05 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන මෙන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටිමි.

සැකකරු :- මොහොමඩ් ජෙමිල් මොහොමඩ් අෆාන්

අංකඃ22/32

මුස්ලිම් පල්ලිය නපාර,

තංගල්ල.

අත්/කළේ,

ස්ථානාධිපති,

වි.අ.වි. අංශය,

මොණරාගල.

2005.07.25

::::::::::::::

<u>2016.01.26 ( විභාගය 03)</u>

වු : ( 1 ) එම්.ජේ.එම්. අෆාන්